024462

**බුද්ධ ශාසන අමාත්‍යාංශය**

**බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව**

**ශ්‍රී බු. ව. 2560 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2016 නොවැම්බර්**

**6 ශ්‍රේණිය** විභාග අංකය:

කාලය : පැය 01

---

(I) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (II) කොටසින් තෝරාගත් ප්‍රශ්න අටකටත් (08) පමණක් පිළිතුරු සපයන්න.
(I) කොටසට ලකුණු (2 ×10) = 20 කි. (II) කොටස සඳහා ලකුණු (10×8) = 80 කි.

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. බෞද්ධයකු තුළ නොතිබිය යුතු අයහපත් ලක්ෂණය මින් කුමක් ද?
    (i) මව්පියන්ට උවටැන් කිරීම. (ii) කළගුණ සැලකීම.
    (iii) මිතුරන් නරක දේට පෙළඹවීම. (iv) සරල ජීවිතයක් ගතකිරීම.

02. "යථාවාදී තථාකාරී- යථාකාරී තථාවාදී ගුණය" තුළින් නිරූපණය වන්නේ.........
    (i) අනතිමානී බවයි. (ii) අවංකකමයි.
    (iii) වංකකමයි. (iv) කාරුණික බවයි.

03. භික්ෂූන් වහන්සේලා සඳහා විනය නීති පැනවීමේදී බුදුරජාණන් වහන්සේට සහය වූයේ කවුද?
    (i) ආනන්ද තෙරණුවෝ ය. (ii) අනුරුද්ධ තෙරණුවෝ ය.
    (iii) උපාලි තෙරණුවෝ ය. (iv) මහාකාශ්‍යප තෙරණුවෝ ය.

04. සිංහල බෞද්ධ සාහිත්‍යයේ එන උපදේශ කාව්‍ය අතුරින් එකක් වන්නේ මින් කුමක් ද?
    (i) එළු සදැස් ලකුණ. (ii) මුවදෙව් දා වත.
    (iii) ලෝකෝපකාරය. (iv) කව්සිළුමිණ.

05. සිල්වතුන් දැකීම, බණ ඇසීම හා දන්දීමට කැමති බව.
    (i) ධනවත්බවේ ලක්ෂණයි. (ii) සිල්වත්බවේ ලක්ෂණයි.
    (iii) සැදැහැවත්බවේ ලක්ෂණයි. (iv) නැණවත්බවේ ලක්ෂණයි.

06. බුදුරජාණන් වහන්සේ තමන්වහන්සේ අවබෝධකර ගත් ධර්මය ගුරුතනතුරෙහි තබාගන්නේ .......
    (i) බුද්ධත්වයට පත් මොහොතේ ය. (ii) පස්වන සතිය අජපාල නුගරුකමුල වැඩහිඳිද්දී ය.
    (iii) සති හත අවසානයේදී ය. (iv) පළමු ධර්ම දේශනාව පවත්වද්දී ය.

07. කාමසුඛල්ලිකානුයෝගයේ හා අත්තකිලමථානුයෝගයේ අයහපත් බව පෙන්වාදෙන සූත්‍ර දේශනය කුමක් ද?
    (i) ධම්මචක්කප්පවත්තන සූත්‍රය. (ii) මහා මංගල සූත්‍රය.
    (iii) සිඟාලෝවාද සූත්‍රය. (iv) සාමඤ්ඤඵල සූත්‍රය.

e - LEARNING HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING

08. ප්‍රථම ධර්ම සංගායනාවෙන් පසු විනය පිටකය පවත්වා ගෙන යාමේ වගකීම පැවරුනේ කාවෙත ද?

(i) ආනන්ද තෙරුන් වෙත ය. (ii) උපාලි තෙරුන් වෙත ය.

(iii) අනුරුද්ධ තෙරුන් වෙත ය. (iv) මහාකාශ්‍යප තෙරුන් වෙත ය.

09. වර්ග විසිහයකින් යුතු **"ධම්ම පදය"** අයත් වන්නේ, ත්‍රිපිටකයේ කිනම් නිකායට ද?

(i) ඛුද්දක නිකායට ය. (ii) දීඝ නිකායට ය.

(iii) අංගුත්තර නිකායට ය. (iv) සංයුත්ත නිකායට ය.

10. **"සිල්වත් සමාගම"** පිහිටුවා ගැනීමට මූලික වූයේ කවුද?

(i) නරේන්ද්‍ර සිංහ රජතුමා ය. (ii) ලෙව්කේ රාළ ය.

(iii) වැලිවිටියේ සරණංකර හිමි ය. (iv) ඇහැලේපොළ මහ අධිකාරම් ය.

(ලකුණු 2 ×10) = 20

## II කොටස

01. හේතුව, කාලය, ස්ථානය, මූලිකත්වය, අනුග්‍රහය, සහභාගිත්වය හා ප්‍රතිඵල යන කරුණු සඳහන් කරමින් පළමු ධර්ම සංගායනාව ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

02. දෙමාපියන් තුළ සිල්වත්කම වැඩිදියුණු කරවීම සඳහා ඔබට කළහැකි දේ මොනවා ද?

03. ජය ශ්‍රී මහාබෝධීන් වහන්සේ උදෙසා වාර්ෂිකව සිදුකරනු ලබන මංගල්‍ය හතරකි. එම හතර නම් කර නානුමුර මංගල්‍යය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

04. ආනාපානසති භාවනාව පුරුදු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන මොනවා ද ?

05. මෙත්තානිසංස සූත්‍රයේ දැක්වෙන පරිදි මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵල 11 කි. ඉන් පහක් නම් කරන්න.

06. චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමෙන් ලැබෙන අවසාන ප්‍රතිඵලය කුමක් ද?

07. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය යනු කුමක්දැයි හඳුන්වා දෙන්න.

08. දෙවියන්ට පින් අනුමෝදන් කරවන ගාථාවක් ලියන්න.

09. මිය ගිය ඥාතීන්ට පිං අනුමෝදන් කරවන ගාථාව ලියන්න.

10. ඔබගේ ශාරීරික පිරිසිදුකම රැක ගැනීම සඳහා කළයුතු දේ මොනවා ද?

11. පිටත අපිරිසිදුකම හා ඇතුළත අපිරිසිදුකම යනු කුමක්දැයි හඳුන්වා, ඒවා අපේ ජීවිතයට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

12. බාහිර පරිසරයේ අපිරිසිදුකම නිසා අපට වැළඳිය හැකි රෝගී තත්ත්වයන් මොනවා ද?

13. විනෝදාස්වාදය ධර්මිකව ලැබියහැකි ආකාර පහක් නම් කරන්න.

14. ඔබගේ ගෙවත්තේ වගා කළහැකි දේශීය ඖෂධ වර්ග දහයක් නම් කරන්න.

15. මල්, පලතුරු, ඔසු වගාව තුළින් අපට ලද හැකි ප්‍රයෝජන මොනවා ද?

ලකුණු (10 ×8) = 80

e - LEARNING
HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING

## බුද්ධශාසන අමාත්‍යාංශය - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

### ශ්‍රී.බු.ව. 2560 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2016

**06 ශ්‍රේණිය** **පිළිතුරු පත්‍රය**

(i) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (ii) කොටසින් තෝරාගත් ප්‍රශ්න අටකටත් පමණක් පිළිතුරු සපයන්න.

(i) කොටසට ලකුණු (2 × 10) 20 කි (ii) කොටස සඳහා ලකුණු (10 × 08) 80 කි.

මූලාශ්‍රය - 06 ශ්‍රේණිය පෙළ පොත

### i කොටස

01 නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

| ප්‍රශ්න අංකය | පිළිතුර | පාඩම | පිටු අංකය | ඡේදය /ගාථාව /පාඨය | ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | (iii) මිතුරන් නරක දේට පෙළඹවීම. | 02 | 05 | 04 | 02 |
| 02 | (ii) අවංකකමයි. | 03 | 07 | 03 | 02 |
| 03 | (iii) උපාලි තෙරණුවෝ ය. | 05 | 17 | 01 | 02 |
| 04 | (iii) ලෝකෝපකාරය. | 06 | 19 | 01 | 02 |
| 05 | (iii) සැදැහැවත් බවේ ලක්ෂණ යි. | 07 | 23 | 07 | 02 |
| 06 | (ii) පස්වන සතිය අජපාල නුගරුක මුල වැඩහිඳිද්දී ය. | 08 | 27 | 02 | 02 |
| 07 | (i) ධම්මචක්කප්පවත්තන සූත්‍රය. | 08 | 29 | 01 | 02 |
| 08 | (ii) උපාලි තෙරුන් වෙත ය. | 09 | 33 | 01 | 02 |
| 09 | (i) ඛුද්දක නිකායට ය. | 13 | 50 | 02 | 02 |
| 10 | (iii) වැලිවිටියේ සරණංකර හිමි ය. | 18 | 77 | 01 | 02 |

### ii කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර | පාඩම | පිටු අංකය | ඡේදය /ගාථාව /පාඨය | ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | හේතුව - ධර්ම විනය පිරිහීමට පත්වෙමින් පැවතීම, සුභද්‍ර භික්ෂුව වැන්නවුන්ගේ මත ඉස්මතුවීම.<br>කාලය - මාස හතකි.<br>ස්ථානය - රජගහනුවර,වේභාර පර්වත පාමුල, සප්තපර්ණි ගුහාව අභියස දී<br>මූලිකත්වය - මහා කාශ්‍යප මහරහතන් වහන්සේ<br>අනුග්‍රහය - අජාසත් රජතුමා<br>සහභාගි වූ ප්‍රමාණය - රහතන් වහන්සේලා 500 නමක්<br>ප්‍රතිඵල - විසිරී පැවති ධර්ම විනය ඒකරාශි කර ධර්මය හා විනය ප්‍රධාන කරගත් බුද්ධ දේශනාවේ ආරක්ෂාව සහ චිර පැවැත්ම සඳහා පියවර ගැනීම. කොටස් වශයෙන් ආචාර්ය පරම්පරා වෙත පැවරීම. | 09 | 31-33 | | 10 |
| 02 | පස්පව්වල ආදීනව කියැවෙන බණ කතා, පුවත්පත් වාර්තා, පද්‍ය රචනා ඇසීමට සැලැස්වීම. උපෝසථ සීලය සමාදන්වීමට උනන්දු කරවීම. සිල් සමාදන් වූ දෙගුරුන්ට උවටැන් කිරීම. මතට ලොල් වූ පියවරුන්ට කරුණාවෙන් එහි ආදීනව පැහැදිලි කර දී ඉන් මුදවා ගැනීම. | 14 | 60 | 03 | 10 |
| 03 | 1. අලුත් සහල් මංගල්‍යය.<br>2. පරණ අවුරුදු මංගල්‍යය.<br>3. නානුමුර හෙවත් අලුත් අවුරුදු මංගල්‍යය.<br>4. කාර්ති මංගල්‍යය.<br>නානුමුර මංගල්‍යය<br>වෙසක් පොහොයට පළමු විසා නැකත උදා වෙනවාත් සමග සෙනසුරාදාවක කෙරෙන මංගල්‍යයකි. මෙයට අටමස්ථානය ම සම්බන්ධ වේ. බුද්ධ පූජා හා බෝධි පූජා ද මෙයට ඇතුළත් වේ. අටමස්ථානයේම භික්ෂූන් වහන්සේලා සහභාගි වීම, බෝධීන් වහන්සේට ආභරණ පැළඳවීම, අටමස්ථානාධිපතීන් වහන්සේ විසින් විශේෂ චාරිත්‍ර කිහිපයක් | 15 | 65<br>66 | 03<br>1-2 | 10 |



E - LEARNING
HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING

| | | | | | |
|---|---|---|---|---|---|
| | අනුගමනය කිරීම මෙම මංගල්‍යයේ දක්නට ඇති ලක්ෂණ කිහිපයකි. මෙය බුදුරදුන් ජීවමාන කාලයේ දෙවියන් සහ අග්‍ර උපස්ථායක වූ ආනන්ද තෙරණුවන් විසින් බුදුරජාණන් වහන්සේට කරන ලද පූජා ආශ්‍රයෙන් ඇතිවූවක්ය යන්න පාරම්පරික පිළිගැනීමයි. | | | | |
| 04 | නරක සිතිවිලි සිතට ඇතුල් නොවීම, පිරිසිදු සිතුවිලි ඇතිවීම, ඇදුම, පීනස, හෘදයාබාධ වැනි රෝග සුවකර ගැනීමට උපකාරී වීම, සිත සන්සුන් හා ප්‍රබෝධමත් වීම, නිරෝගි බව ඇතිවීම, ගත සිත සැහැල්ලු වීම, මතක ශක්තිය වැඩිවීම. | 10 | 37 | 03 | 10 |
| 05 | 1. සැපසේ නින්ද යාම, 2. සැපසේ පිබිදීම. 3, නරක සිහින නොපෙනීම. 4.මනුෂ්‍යයන්ට ප්‍රිය වීම. 5.අමනුෂ්‍යයන්ට ප්‍රිය වීම. 6.දෙවියන් රැකීම. 7.විපත්වලින් ආරක්ෂා වීම. 8.වහා සිත සමාධිගතවීම. 9. මුහුණ ප්‍රසන්න වීම. 10. සිහි ඇතිව මරණයට පත්වීම. 11. මෙලොවදී රහත් ඵලයට පත් නොවීනම් බඹලොව උපත ලැබීම. | 19 | 84 | 03 | 10 |
| 06 | සසර ගමන නවතා දුක් නැතිකර නිවන්සුවය ලබාගැනීමට හැකිවන්නේ චතුරාර්ය සත්‍යය අවබෝධ කරගැනීමෙනි. | 17 | 73 | 04 | 10 |
| 07 | එයින් කියැවෙන්නේ දුක ඇතිවීමට හේතුව යි. දුක ඇතිවීමට හේතුව තණ්හාව යි. තණ්හාව නිසා සත්වයා සසරට බැඳෙයි. නැවත උපදියි. නැවත නැවත ජරාවට මරණයට පත්වෙයි. ඒ ඒ තැන දැඩිව අල්වාගනී. කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා ලෙස තණ්හාව තුන් ආකාර ය. | 17 | 73 | 07 | 10 |
| 08 | එත්තාවතා ච අම්හේහි - සම්භතං පුඤ්ඤ සම්පදං<br>සබ්බේ දේවා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා<br>හෝ<br>ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවා නාගා මහිද්ධිකා<br>පුඤ්ඤං තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු ලෝක සාසනං<br>/ දේසනං/ මං පරං | 20 | 87 | 2-3 | 10 |
| 09 | ඉදං වෝ/මේ ඤාතීනං හෝතු සුඛිතා හොන්තු ඤාතයෝ. | 20 | 87 | 07 | 10 |
| 10 | දිනපතා ස්නානය. උදේ සවස දත් මැදීම. නිය කැපීම. හිස පීරීම. කෙස් කැපීම, පිරිසිදු ඇඳුම් ඇඳීම. පාවහන් පැළඳීම. නිවස/වැසිකිලි/කැසිකිලි හා අවට පරිසරය පිරිසිදුව තබාගැනීම. | 22 | 93 | 03 | 10 |
| 11 | පිටත අපිරිසිදුකම - බාහිර පරිසරය, බාහිර ශරීරය, නිවස, වැසිකිලි කැසිකිලි හා අවට පරිසරයෙහි අපිරිසිදු කම. එමගින් ශාරීරික රෝග ඇතිවේ.<br>ඇතුළත අපිරිසිදුකම - සිතේ අපිරිසිදුකමයි. කෙලෙස් නිසා සිත අපිරිසිදු වේ. අපිරිසිදු සිත නිසා බාහිර පරිසරය පිරිසිදුව තබා ගැනීමට ද හැකියාවක් නැත. එමගින් ශාරීරික හා මානසික රෝග වැළඳෙයි. | 22 | 95 | 2-3 | 10 |
| 12 | පාචනය, සෙංගමාලය, වෛරස් රෝග, ඩෙංගු, සෙම් රෝග, උණ ආදිය.. | 22 | | | 10 |
| 13 | කවි ගී ගැයීම, සංගීත වාදනය, නාට්‍ය බැලීම, කවි ලිවීම, ගීත ලිවීම, ස්වභාව සෞන්දර්යය රසවිඳීම, පොත් කියවීම, විනෝද, වන්දනා ගමන් යාම, පැල සිටුවීම, මල් වැවීම. | 25 | 101 | 01 | 10 |
| 14 | කෝමාරිකා, ගොටුකොළ, හාතවාරිය, අක්කපාන, කහ, ඉගුරු, දෙහි, අරත්ත, ඉරිවේරිය, බැවිල, පොල්පලා, කටුවැල්බටු, සඳුන්, රසකිඳ, කටුකරෝසන, පාවට්ටා, කොතමල්ලි, රණවරා  ආදිය... | 25 | 104 | 01 | 10 |
| 15 | පිරිසිදු ආහාර ලෙස ප්‍රයෝජනයට ගැනීම. නිවසේ ආලින්දය මලින් සැරසීම. මල්, පලතුරු, ඔසු පින්කම්වලට දීම, ත්‍යාග කිරීම, මල් පැණි බොන, ඵල කන සතුන් දැක සතුටුවීම, ගිලනුන්ට දීම, මල්, පලතුරු, ඔසු වර්ග අන් අයට හඳුන්වා දීම, වඳවී යන මල්, ඖෂධ වර්ග ආරක්ෂා කර ගැනීම. | 25 | 104 | 03 | 10 |

e - LEARNING
HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING
WEB | YOUTUBE | OTHER SOCIAL MEDIA | BOOK PUBLISHER | PRESS